# පවුල් පසුබිම් වාර්ථාවට සති දෙකයි...

### සංවර්ධන නිළධාරීන් අවංකව සේවය කරන්න..

### වැරදි කලොත් තරාතිරම නොබලා දඬුවම් දෙනවා..

### ඇමතිනි නීතීඥ තලතා අතුකෝරළ

මෙතෙක් අවිධිමත්ව ක්‍රියාත්මක වූ පවුල් පසුබිම් වාර්ථාව ලබාදීමේ කාලය ඉදිරියේදී සති දෙකක් තුළදී සැකසීමට පියවර ගන්නා බව, විදේශ රැකියා අමාත්‍ය නීතීඥ තලතා අතුකෝරළ මහත්මිය ප්‍රකාශ කළාය. ඇමතිතුමිය මේ අදහස් පළකළේ, ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අනියුක්තව සේවය කරන සංවර්ධන නිළධාරීන්ගේ හමුවකදීය. එය 2015.02.09 වන දි විදේශ සේවා නියුක්ති කාර්යාංශ ප්‍රධාන කාර්යාලයේදී පැවැත්විණි. මෙම අවස්ථාව සඳහා දිවයින පුරා සිටින සංවර්ධන නිළධාරීන් 900කට අධික පිරිසක් එක්වී සිටියහ. එහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ අමාත්‍යවරිය, "අපි දන්නවා විදේශ රැකියා ක්ෂේත්‍රයට සංවර්ධන නිළධාරීන් විශාල සේවයක් කරනවා. ඔවුන් ග්‍රාමීය මට්ටමට ගොස් විදේශ රැකියා සඳහා පිටත්වන පවුල් මුණගැහිලා විවිධ වාර්ථා සකසනවා. පවුල් පසුබිම් වාර්තාවත් ඉන් එකක්. අද සමාජයේ විශාල ප්‍රශ්නයක් වෙලා තියෙන්නේ මව හෝ පියාගේ රැකවරණය නොමැතිව දරුවන් අතරමංවීම. එම නිසා කුඩා දරුවන්ට මව් සෙනෙහස, පිය සෙනෙහස අහිමි වෙලා. කාන්තාවක් විදිහට මට එය හොඳින් දැනෙවා. කුඩා දරුවන් තනිකර රට යාම අද විශාල ගැටළුවක්. ඇතැම් අය පවුල් පසුබිම් වාර්ථාව වැරදි විදිහට හදනවා. කුඩා දරුවන් ඉන්න පවුල්වල, එවැනි දරුවන් නොමැති බවට ව්‍යාජව පවුල් පසුබිම් වාර්තා සකසනවා. පසුගිය කාලයේ එහෙම හදපු සංවර්ධන නිළධාරීන් 10 දෙනෙකු රැකියාවෙන් ඉවත් කළා. එම නිසා පවුල් පසුබිම් වාර්ථාව වැරදි විදිහට හැදුවොත් තරාතිරම නොබලා දඬුවම් දෙන්න මම නියෝග කරලා තියෙනවා. අපි දන්නවා සංවර්ධන නිලධාරීන්ගෙන් බහුතරය අවංකව වැඩ කරනවා. කිහිප දෙනෙක් පමණයි මෙහෙම කරන්නේ. එය නවත්තන්න ඕනි. වැරදි දේ කොහොමත් අපි නතර කරනවා. රටවිරුවන් නමින් කොපමණ වැඩ කළත් එහි ප්‍රතිඵලය ඔවුන්ට ලැබෙන්නේ නැත්නම් ඒක වැඩක් නෑ. ඒක නිසා රටවිරුවන් නමින් වැඩසටහන් මින් ඉදිරියට නෑ. විගමනික ශ්‍රමිකයින් වෙනුවෙන් අපේ රජය විශාල වැඩකොටසක් කරනවා. රජයේ දින 100 තුළ සංවර්ධන නිළධාරීන්ගෙන් ඉටුවිය යුතු කාර්යභාරය පිළිබඳව ඔවුන් දැනුවත් කළා. දින 100න් පසුවත් ඒ වැඩ කොටස ක්‍රියාත්මක කරන්න අපි බලාපොරොත්තුවෙනවා. ඒ සඳහා උපරිම සහය අවශ්‍යයි."

විදේශ රැකියා අමාත්‍ය තලතා අතුකෝරළ මහත්මිය වැඩිදුරටත් කියා සිටියේ, පවුල් පසුබිම් වාර්ථාව සැකසීමේදී අවිධිමත් ලෙස කාලය ගෙන ඇති බවයි. ඇතැම්විට කඩිනමින් එම වාර්ථා සැකසීමේදී වංචනික ක්‍රියාවන් සිදුවන බවත් මින් ඉදිරියට පවුලේ තොරතුරු නිවැරදිව සොයාබලා සති දෙකක් තුළ අදාළ වාර්ථාව සකස් කිරීමට සියළුම සංවර්ධන නිළධාරීන් පියවර

ගතයුතු බවද, ඇය සඳහන් කළාය. ඒජන්සි ආයතනවලට හෝ වෙනත් පුද්ගලයින්ගේ උවමනාව මත පවුල් පසුබිම් වාර්ථාවන් වංචනිකව සකස් කිරීමට ඉඩ නොතබන බවද ඇය ප්‍රකාශ කළාය.

මෙම අවස්ථාවට සහභාගි වූ විදේශ රැකියා අමාත්‍යාංශයේ ලේකම් ජී.එස්. විතානගේ මහතා සඳහන් කළේ, විදේශ රැකියා ලාභීන් වෙනුවෙන් තම අමාත්‍යාංශය ඉදිරියේදී විශාල වැඩකොටසක් ඉටුකරන බවයි. ඒ අනුව, සුභසාධන පහසුකම් තවදුරටත් පුළුල් කරන බවද ඔහු සඳහන් කළේය. විගමනික ශ්‍රමිකයින් විදේශ ගතවූ සැනින් විනාඩි 5-10 ත් අතර කාලයකදී එහි සියළු තොරතුරු සංවර්ධන නිළධාරීන්ට ඊමේල් SMS මඟින් දැනගැනීමට වැඩපිළිවෙලක් සකස් කරන බවද ඔහු සඳහන් කළේය. එසේම සංවර්ධන නිළධාරීන් මඟින් අදාළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ විදේශගත ශ්‍රමිකයින්ගේ පවුල්වල සාමාජිකයින්ගේ සියළු තොරතුරු ලබාගැනීමටද, ප්‍රමුඛ අවශ්‍යතාවයන් වන දූදරු රැකවරණය හා සමාජ සුභසාධනය සැලකීම වැනි පුළුල් මෙහෙවරක් ක්‍රියාත්මක කිරීමට සැලසුම්කර තිබෙන බවද, අවධාරණය කළේය. ඒ, අනුව සංවර්ධන නිළධාරීන් විසින් තම ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ විදේශ ගත ශ්‍රමිකයින්ගේ සියළු තොරතුරු යාවත්කාලීන කර තබාගැනීම් ක්‍රමය ඉක්මණින්ම ක්‍රියාවට නැංවීමට බලාපොරොත්තු වන බවද හෙතෙම අවධාරණය කළේය.

මෙම අවස්ථාවට විදේශ රැකියා අමාත්‍යාංශයේ අතිරේක ලේකම්, අයි.ටී. වීරසිංහ මෙනෙවිය, විදේශ සේවා කාර්යාංශයේ සාමාන්‍යාධිකාරී හරිස්චන්ද්‍ර බටගොඩ යන මහත්ම මහත්මීන් ඇතුළු නිළධාරීන්ද එක්වී සිටියහ.